ශ්‍රී ලංකා ක්‍රිකට් පිලේ හිස්තැන පිරවූ

ෆර්වේස් මහරූෆ්

ක්‍රිකට් ක්‍රීඩාව පන්දු යැවීම, පන්දුවට පහරදීම හා පන්දු රැකීම යන ක්‍රියාකාරකම් ත්‍රිත්වයේ එකතුවෙන් සැදුම් ලත් ක්‍රීඩාවක් ලෙස බොහෝ කාලයකට පෙර සිටම හඳුන්වා දෙනු ලැබීය.
එසේ වුවත් අදවනවිට ඊට කඩුළු රැකීම යන විශේෂිත ක්‍රියා කාරත්වයද ඇතුළත් කොට ක්‍රියාකාරකම් හතරකින් සමන්විත ක්‍රීඩාවක් ලෙස හඳුන්වා දෙන පිරිස්ද සිටින බව සඳහන් කළ යුතුය.
අතීතයේදී ක්‍රිකට් කණ්ඩායමක් නිර්මාණය කරනු ලබන්නේ ප්‍රධාන වශයෙන් විශේෂඥ පිතිකරුවන් හා විශේෂඥ පන්දු යවන්නන් යන කොටස් දෙක සංයෝග කිරීමෙනි.
එහෙත් අද තත්ත්වය ඊට වඩා වෙනස්ය. විශේෂයෙන්ම එම වෙනස ඇති කරන්නට මූලිකවම බලපෑ කරුණ ලෙස සඳහන් කළ හැක්කේ සීඝ්‍ර පන්දු වාර ක්‍රිකට් ක්‍රීඩාව බිහිවීමය. එක් දිනකදී අවසන් වන මෙවන් තරගයකදී කිසියම් කණ්ඩායමකට ජයග්‍රහණය පහසු කරන්නේ පන්දුවෙන් මෙන්ම පිත්තෙන්ද සිය කණ්ඩායමට එක හා සමානව උපකාර කළ හැකි ක්‍රීඩකයින් වැඩි පිරිසක් සිටීමෙන් වහ සෘජ රටක්ම මේ වනවිට තේරුම් ගෙන අවසන්ය.
එබැවින් වර්තමානයේ ඕනෑම කණ්ඩායමක වැඩි අවස්ථාවක් ලැබෙන්නේ ලකුණු රැස්කරමින්, පන්දු යැවීමෙන් සම හැකියාවන් ඇති ක්‍රිකට් ක්‍රීඩකයන්ටය.
එය ශ්‍රී ලංකාවටද පොදු කරුණකි. එහෙත් තවමත් ශ්‍රී ලංකා ක්‍රිකට් පිලට ඒ අවශ්‍යතාව සම්පූර්ණයෙන්ම සපයා ගන්නට නොහැකි වී ඇත.
පන්දුව මෙන්ම පිත්ත හුරු ක්‍රිකට් ක්‍රීඩකයකු වශයෙන් දිගු කලක් තිස්සේ ශ්‍රී ලංකා පිලේ ස්ථාවරව සිටින එකම ක්‍රීඩකයා ලෙස චමින්ද වාස් සඳහන් කළ හැකිය. ඒ අනුව කලක් ගතවනතුරුම වාස් ශ්‍රී ලංකා පිල තුළ තනිව සිටියේය.
එහෙත් මෙතෙකදී ඔහුගේ තනිකම මකා දමන්නට තවත් එක් ක්‍රීඩකයෙකු සමත් වී තිබුණි. ශ්‍රී ලංකා ක්‍රිකට් පිලට අවශ්‍යව තිබූ මොහොතක අත්‍යවශ්‍ය ක්‍රීඩකයෙකු ලෙස එක්වූ ඔහු නමින් ෆර්වේස් මහරූෆ් ය. කොළඹ වෙස්ලි විද්‍යාලින් අධ්‍යාපනය ලද මහරූෆ් පාසැසැඳේදී ක්‍රිකට් ක්‍රීඩාවට යොමුවෙයි කඩුළු රකින්නෙකු වශයෙනි.

නමුත් වයසේ හැටියට එවකට ඔහු සතුව තිබූ උස කඩුළු රකින්නකුට තිබිය යුතු උස ඉක්මවූවක් විය. එසේම එම උස වඩාත් උචිත වූයේ වේගපන්දු යවන්නෙකුටය. ඕනෑම ක්‍රීඩකයකුට වඩාත් සුදුසු දේ තෝරාදීම හා එහි උපරිමයට ළඟවීම පිණිස අනුගමනය කළ යුතු දේ පහදා දීමේ හැකියාව පුහුණුකරුවකු වෙත තිබිය යුතු ගුණාංගයක්ය. මහරූෆ්ගේ පුහුණුකරු එම ගුණාංගයන්ගෙන් පෝෂණය වී සිටිමින් අද ශ්‍රී ලංකා ක්‍රිකට් පිලට අතඟවාශෙව තිබූ ක්‍රීඩකයෙකු බවාදීමට හේතු වී ඇත.
මහරූෆ් කඩුළු රැකීමෙන් ඉවත් කොට ඔහු වේගපන්දු යවන්නෙකු කිරීම නිසා පාසල් දිවියට ආයුබෝවන් කියා වැඩි කාලයක් ගතවීමටත් පෙරම ඔහුට ශ්‍රී ලංකා පිලේ දොර විවෘත විණි.
වේගපන්දු යවන්නෙකු ලෙසත් මැද පෙළ ප්‍රහාරක පිතිකරුවෙකු ලෙසත් කුසලතා දක්වන්නට සමත් වූ ෆර්වේස් මහරූෆ් ශ්‍රී ලංකා අවුරුදු 15 න් පහල කණ්ඩායම් කණ්ඩායමේ නායකත්වයද 2004 වසරේ පැවැති අවුරුදු 19 න් පහල ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලියේදී ශ්‍රී ලංකා පිලේ නායකත්වයද හිමිවී තිබුණි.
පිතෘන් සිට අතර මග තනර නොවී ආපසු හැරී නොබැලූ ඔහු මේ වනවිට ජාතික පිලට නැතුවම බැරි ක්‍රීඩකයෙකු වී අවසන්ය.
ශ්‍රී ලංකාවට ලකුණු අවශ්‍යම වී ඇති අවස්ථා කිහිපයකදීම ඔහු මේ වනවිටත් සිය යුතුකම් කොටස ඉටු කරන්නට සමත් වී ඇත. එසේම ප්‍රතිවාදී ක්‍රීඩකයින් දැඩෙදෙනෙකු පවත්වාගෙන යන සබඳතාවක් බිඳ දැමීය යුතු තීරණාත්මක අවස්ථාවලදී ඔහු ඒ යුතුකමද ඉටුකරන්නට සමත් වී ඇති අවස්ථා එමටය.
ඝෙතකදී ඉන්දියාවේ පැවැති අයි.සී.සී. චැම්පියන්ස් කුසලාන ක්‍රිකට් තරගාවලියේදී මහරූෆ් බටහිර ඉන්දීය කොදෙව්වන් සමග පැවැති තරගයේදී තරගාවලියේ දෙවන හොඳම පන්දු යැවීම සටහන් කළේය.
ශ්‍රී ලංකාව සිංහල. ද්‍රවිඩ හා මුස්ලිම් වශයෙන් ප්‍රධාන ජාතීන් 3ක් මිශ්‍රව වාසය කරන රටකි. වර්තමානයේ එකිනෙකා සැක කිරීම හා එකිනෙකාට වෛර කිරීම යන හේතූන් නිසාවෙන් ඔවුන් අතර අසමගිය ඔඩු දුවා පිළිකාවක් හටගෙන ඇත.
ක්‍රිකට් පිරිමැදි කිසියම් පිලක් පන්දු යැවීම, පන්දු රැකීම හා පන්දුවට පහරදීම යන තුන් ඉරියව්වෙන් පෙන්වන දක්කම් මත ජයග්‍රහණය වෙත පියවර තබන ආකාරයෙන් ශ්‍රී ලංකාව සංවර්ධනය කරා වේගයෙන් රැගෙන යාමට නම් සිංහල, ද්‍රවිඩ හා මුස්ලිම් යන ජාතීන් තුන සාමකාමීව හා එක්සත්ව අත්වැල් බැඳ ගතයුතුය.
මුත්තයියා මුරලිදරන්ගේ ආගමනයෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් පිලට අවශ්‍යව තිබූ ද්‍රවිඩ ජාතිකයෙකුගේ එක්වීම සිදුවිය. එහි මනෙක් පැවති නිත්‍ය මුස්ලිම් ජාතිකයෙකුගේ අඩුව පුරවන්නට දැන් ෆර්වේස් මහරූෆ් අවස්ථාව හිමිවී ඇත. ඒ අනුව තුන් ඉරියව්වෙන් සමන්විත ක්‍රිකට් ක්‍රීඩාව වෙනුවෙන් නිර්මාණය කළ ශ්‍රී ලංකා පිල දැන් ජාතීන් තුනට අයත් ක්‍රීඩකයන්ගෙන් සම්පූර්ණය.
මේ නිසා දැන් කළ යුත්තේ එකම පවුලේ සෙහොදරුන් ලෙස ක්‍රීඩා පිරිසේදී සාමූහිකව තරග වැදී ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාව ජයග්‍රාහී මාවතේ ඉහළම ස්ථානයට රැගෙන යාමය. තවද එසේ කරමින් සමස්ථ ශ්‍රී ලාංකිකයින්ටම යහපත් ප්‍රථිවාදීයෙක් ලබා දීමද අප්‍රමාදව කළ යුතුය.

කසුන් සේනාරත්න

කිසිවකු එය අතරමග නතර නොකළ යුතු බවද සඳහන් කළේය.

අවම වශයෙන් දකුණු ආසියාතක රටවල හෝ වාත්තීය ලීටිවම පන්දු ක්‍රීඩාවේ නියැලීමට සුදුසු ක්‍රීඩකයින් පිරිසක් ශ්‍රී ලංකාවේ සිටින බව පවසන ඔහු එහෙත් ඒ සුදුසුකම්වලට සරිලන අවස්ථා ඔවුනට මෙතෙක් ලැබී නැති බවද කියා සිටියේය. ඔබට විදේශ රටක පුර්ණ කාලීන වෘත්තීය පාපන්දු ක්‍රීඩකයෙකු ලෙස ක්‍රීඩා කිරීමේ අවස්ථාව ලැබුනහොත් හාර ගන්නවාදැයි ඇසන ලද පැනයකට ඔහු ලබාදුන් පිළිතුර මෙහි සඳහන් කළ යුතුය.
කසුන් එදා දෙපසට ගිය වනමින් පුකාශ කර තිබුනේ තමන් සතුව දැනට පවතින හැකියාවෙන් සියයට 60 කට වඩා තවමත් ශ්‍රී ලංකාවට ලබා දී නැති බැවින්දැ අතිරේ සියයට 40ක සේවය ලබා දීමට තමන්ට තවත් ක්‍රීඩා කිරීමට ඉතිරිව ඇත්තේ වසර 5ක පමණ කාලයක් බැවින්දැ ඒ කෙටි කාලසීමාව තුළ සිය කුසලතා විදේශ රටකට මුදලට විකිණීමට අකමැති බවය.

ශ්‍රී ලංකාවට අවශ්‍යව ඇත්තේ එවන් අදහස් ඇති ඳු පුතුන්ය. ඉතිං අපි ඔහුට දිගුකල් දිනෝවායි සුබ පැතිය යුතුය.

බාල වග

පසුතැවීමට හේතු වන දේ කොකළ යුතු ය

සැවැත් නුවර දෙවිරම වෙහෙරෙදී.

න හං කම්මං කතං සාධු,
යං කත්වා අනුතප්පති
යස්ස අස්සුමුඛෝ රෝදං
විපාකං පටිසේවති

කළුළු පිරුණු මුහුණින් යුතුව
පසුතැවිලිලට හේතුවන
දුක් විඳීමට හේතුවන
පව කම් නොකිරීම යහපති.

Na tam kammam katam sadu
Yam katva anutappati
Yassa assumukho rodam
Vipakam patisevati

That deed is not well done
When after having done it
One repents, and when weeping
With tearful face, one reaps the fruit
thereof.

සීඝාන ගොවියකු ඇරැඹ

විස සතෙකු වැනි මහු පිසුල්ල

ගොවියෙක් සැවැත් නුවරට නුදුරු ගමක කුලුරක් සී සෑම පිළිවස අළුයම කුලුරට ගියේ ය. අව රශ්මිය වැළී ඒමට පෙර, වැඩ අතවර කිරීමට ගොවියා ඉක්මණින් වැඩ කළෙය. පෙර දින රැයේ සොර මුලක් නගරයේ සිටු ගෙයක් බිඳ පලා ගිය හ. එක් සොරෙක් අත් අයට හොරෙන් මසුරන් පොදියක් සඟවා ගත්තේ ය. මේ හොරු ගොවියා සී ඝාන කුලුරට විත් සොරාගත් ධනය ගෙවුලාගන රාලිගේම පලා ගිය හ. තම සඟයනට හොරෙන් සඟවා ගත් මසුරන් පොදිය පෙර සී හොරාව අමතකව ඊම දමා පලා ගියේ ය.

මහා කරුණා මහිමයෙන් යුත් බුදුපියාණන් වහන්සේ අළුයම ලොව බලන රවිලේ මෙම ගොවියාත්, ඔහුට සිදුවන්නට යන විපතත්, කෝවාන් පලයට පැමිණීමට ඇති පිනත් දිව්‍යසීන් දැක අනඳ තෙරුන් වහන්සේ සමඟ අළුයම ගොවියා සී ඝාන කුලුරට වැළී සේක. සී ඝාණි සිටින ගොවියා බුදු හිමියන් වැඳීමෙන් පසු සී ඝාණමේ යෙදුනාක් ය. බුදු පියාණන් වහන්සේ මසුරන් පොදිය වැටී ඇති තැනින වඩින විට අනඳ තෙරුන් වහන්සේ අමතා ඛණ්ඩාතන්දය, විස කරපයා පුටුවේදැයි ඇසූහ. අනඳ තෙරුන් වහන්සේද ඛච්ච සතා පුටුවේ යැයි පිළිතුරු දුන්හ.

බුදු හිමියන් සහ අනඳ හිමියන් දුරට වැළැය පසු ගොවියා විස සතා බැළීමට එතැනට පැමිණියත් පුටුවේ සතෙකු නොව මසුරන් පොදියයි. එය රැගෙන වළලා තබා යළිත් සී ඝාන්නට පටන් ගත්තේ ය.

රජයේ නිලධරයෝ බ- හිමියන් සමඟින් පා ඝටහන් හා නොයෙක් ඝාධකයන් පිරක්ෂමින් ගොස් බ- බෙදූ තැන් සහ වස්තුව වැළිලු තැන්ද සොයා ගත් හ. කුලුරෙහි වළඳමා තිබූ මසුරන් තොගය නිසා සී ඝාමින් සිටි ගොවියා අල්ලා ගන්හ.

රී, සොරකම් කොට බ- සඟවා තබා දැන් කිසිවක් නොදන්නකු අයුරින් සී ඝාන අයුරු බලව යි පවසමින් ගොවියාට වද දෙමින් රජ කරා පැමිණ දඬුවම් පැනවී ය. එවිට ගොවියා ලෙසේ කිසිය, බුදුපියාණන් වහන්සේ මේ මසුරන් පොදිය දැක විස සතු දිව් දැයි ඇසුයේ මේ විපත දැන ගෙන විය යුතුයයි සිතා ගොවියා ආනන්දය විස සතු පුටුවේදැයි කීප විටක කීවේ ය. මේ ගැන කරුණු විමසූ නිලධරයෝ ගොවියා වරදදන් නිදහස් කර වූයේය.

මෙම සිදුවීම හේතු කරගෙන බුදුපියාණන් වහන්සේ ඛසිහි කළ පමණින් පසුතැවීමට හේතුවන කඳුලෙන් තෙත් වූ මුහුණු ඇතිව විපාක විඳීමට සිදුවන නරක දේ නොකිරීම ඉතා යහපතැයි දෙසා ගොවියා සෝවාන් පල පිළිවවූ සේක.